# ඉන්දියාව පරදවමු

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අවසානයේ දී අපට ණයක් ලැබී ඇත. ඒ සමග අපේ විදේශීය මූල්‍ය සංචිතය ද ඉහළ යනු ඇත. ඒ කෙසේ වෙතත් මා මෙහි දී අවධානය යොමුකරන්නේ ණය ලබාගැනීම ගැන නොව ණය ලබාගැනීමේ දී අපට ඊනියා බුද්ධිමතුන්ගේ විශේෂ උපකාරයක් අවශ්‍ය නොවීම පිළිබඳව ය. ජාත්‍යන්තර සමුළුවල දී වඩා වැදගත් වන්නේ එයට සහභාගිවන අපේ නියෝජිතයාගේ බුද්ධිය හෝ කථිකත්වය හෝ වෙනත් පෞද්ගලික හැකියාවක් හෝ නොව රටේ ප්‍රතිපත්ති හා එයට අනෙක් රටවල් ප්‍රතිචාර දක්වන ආකාරය ය. මෙරට ඉංගිරිසි කතාකරන අයට මේ බව තේරුම්ගැනීමේ හැකියාවක් නැත. ඔවුහු පසුගිය දා ජිනීවාහි දී එක්සත් ජාතීන්ගේ සංවිධාන සමුළුවක දී ලංකාවට පන්ද විසිනවයක් හිමි වී ජය ලැබීම ඊනියා බුද්ධිමතකුගේ හැකියාව නිසා සිදුවූවක් ලෙස සලකමින් අනෙක් අයට ද ඒ බව ඒත්තුගැන්වීමට උත්සාහ කළහ. එහෙත් මෙරට ඉංගිරිසි කතානොකරන ජනයා ඒ ප්‍රචාරවලින් නොමග යැවීමට නො හැකි විය. ජාත්‍යන්තර සමුළුවල දී වැදගත්වන්නේ ඒ ඒ රටේ විදේශ හා අභ්‍යන්තර ප්‍රතිපත්ති බව පැහැදිලි ය. ඉහත කී ඊනියා බුද්ධිමතා ජිනිවාහි අප නියෝජිත තනතුරින්  ආපසු කැඳවීමට ආණ්ඩුව බුද්ධිමත් තීරණයක් ගෙන ඇත. කොටි පැරදවීමෙන් පසු ඒ ඊනියා බුද්ධිමතාට මෙරට ප්‍රතිපත්තිය නියෝජනය කළ නොහැකි බව පැහැදිලි ය. එහෙත් ඉංගිරිසි පුවත්පත්වල ඒ සම්බන්ධ විශාල මතයක් ගොඩනගා ඊනියා බුද්ධිමතා ආපසු කැඳවීමේ තීරණය වෙනස්කිරීමට උත්සාහයක් ගනු දැකිය හැකි ය. එහි දී ඒ ඊනියා බුද්ධිමතා වෙනුවෙන් වඩාත් ම පෙනී සිටින්නෝ විය යුතු පරිද්දෙන් ම දහතුන ධන කණ්ඩායමේ ඊනියෝ ප්‍රබුද්ධයෝ ය.

මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති පදවියට පත්කිරීමට මේ ඊනියා ප්‍රබුද්ධයන් ගත් උත්සාහයක් නැත. ඔවුහු ඒ මහතාගේ අපේක්ෂකත්වයට විරුද්ධ වූහ. තිස්ස විතාරණ ඩිව් ගුණසේකර වැන්නෝ ද ජනාධිපතිවරණයේ දී එතරම් කාර්යයක් ඉටු නො කළහ. අනෙක් අතට ඔවුන් මහන්සි වුව ද තමන්ට ද ඡන්දයකින් දිනා පාර්ලිමේන්තුවට පත්වීමට නොහැකි ඔවුන් ඇතුළු කසිකබල් මාක්ස්වාදීන් කී නිසා ඡන්දය දෙන්නන් අද මෙරට නැත. එවැන්නන්ට පාර්ලිමේන්තු යෑමට ජාතික ලැයිස්තුව ඇත. එහෙත් මහින්ද රාජපක්ෂ මහතාට ජනාධිපතිවරණයේ දී විරුද්ධවූවෝ ද එතරම් සහයෝගයක් නොදැක්වූවෝ ද නොයෙකුත් රාජ්‍ය නොවන සංවිධානවල සේවක බැළයෝ ද නැවතත් කරළියට පැමිණෙමින් සිටිති. මොවුහු මැතක්වන තුරුම කොටි අනභිබවනීය යැයි කීහ. එමෙන් ම ඔවුහු අර ඊනියා බුද්ධිමතා වෙනුවෙන් කඩේ යන්නෝ වෙති. මොවුහු කොයි කවුරුත් දහතුන ධන කාරයෝ වෙති. මේ දහතුන ධන කාරයන්ට අද ඉංගිරිසි පුවත්පත් ඔස්සේ තරමක බලයක් ලැබී ඇත. ඒ ඔවුන්ගේ දක්ෂකමක් නිසා සිදුවන්නක් නොවන්නේ ඔවුන් දක්ෂයන් නොවන බැවිනි. ඔවුහු එදා බටහිර මුදලින් ජීවත්වූවා මෙන් අද ඉන්දීය මුදලින් ශක්තිය ලබති. එදා මේ ව්‍යාජ ප්‍රබුද්ධයන්ට ශක්තිය වූයේ බටහිර රටවල් නම් අද ශක්තිය වන්නේ ඉන්දියාව ය. ඉන් කියැවෙන්නේ අද ඔවුන් බටහිරින් ඈත්වී ඇති බව නො වේ. ඔවුන්ට අද ඉන්දියාවෙන් ආත්ම ශක්තියක් ලැබෙයි.

මහින්ද රාජපක්ෂ මහතාට ජනාධිපතිවීම සඳහා වැඩිපුර ම ආධාර කෙළේ ජනතා විමුක්ති පෙරමුණ, ජාතික හෙළ උරුමය හා දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරය ආදී ජාතික සංවිධාන ය. කෙටියෙන් කියන්නේ නම් පනස්හයේ දරුවන් ය. ඔවුන්ගෙන් ඇතැමෙක් අයාලේ යති. එහෙත් ඔවුහු පනස්හයේ දරුවෝ වෙති. පනස්හය නිසා ම විශ්වවිද්‍යාලයට ඇතුල් වී ඉන්පසු ඉංගිරිසි ටිකක් කටගාගෙන අද පනස්හයට බැණවදින ඊනියා ෆුල්බ්‍රයිට් තබා ක්වෝටර් බ්‍රයිට්වත් නැති පඬියෝ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු අතර වෙති. මේ එකකු දෙදෙනකු සමග පේරාදෙණියේ දී ප්‍රසිද්ධ වාදයකට සහභාගි වීමට ඇත්නම් අගනේ ය. පුවත්පත් සංවාදවල දී මෙන් නොව එවිට එක් පාර්ශ්වයකට කට උත්තර නැතිවන තෙක් විවාද කළ හැකි ය. ඒ කෙසේ වෙතත් මහින්ද රාජපක්ෂ මහතා මෙන් ම ඒ මහතාට ජනාධිපතිවීමට ආධාර කළ අය ද දහතුනට විරුද්ධ වූහ. ඔවුහු දහතුන පදනම් වූ ද ජාතිය පාවා දුන්නා වූ ද ඉන්දු ලංකා ගිවිසුම නමින් හැඳින්වෙන ජේ ආර් ජයවර්ධන කෑ ඉන්දු ලංකා පරිප්පුවට ද විරුද්ධ වූහ. පිටකොටුවේ බෝධීන් වහන්සේ අසළ සත්‍යග්‍රහ කළහ. කසිකබල් මාක්ස්වාදීහු එයට සහභාගි නොවූහ.  එපමණක් නොව මහින්ද රාජපක්ෂ මහතා ද ඒ මහතාට ජනාධිපතිවීමට ආධාර කළ පනස්හයේ දරුවෝ ද චන්ද්‍රිකාගේ හා ජී එල් ගේ පැකේජයට විරුද්ධ වූහ. පැකේජය යනු අන්කිසිවක් නොව ජනතාව අතින් ප්‍රතික්ෂෙප වූ දහතුන ධන ප්‍රකාශනයක් බව අමතක නොකළ යුතු ය. දහතුන ධන ප්‍රකාශනයක් බහුතර ජනතාව විසින් ප්‍රතික්ෂෙප කරනු ලැබුයේ කොටි ත්‍රස්තවාදීන් බටහිර අරමුදල්වල බලයෙන් මුළු රටට ම තර්ජනාත්මක ව අභියෝග කරමින් සිටි අවස්ථාවක ය. බටහිරයන් තම සුරතල් නියෝජිතවරිය වූ චන්ද්‍රිකා මෙරටට එවා (එදා ඇය ගෙන්වූවන්ගෙන් සමහරු අද ආණ්ඩුවේ ඇමතිවරු වෙති. එහෙත් ඔවුන්ට ද

© Prof. Nalin De Silva

අනාගතයේ දී ජාතික ලැයිස්තුව හැරෙන්නට අන් සරණක් නැත) ඇයු ලවා ඇගේ ස්වාමිපුරුෂයාගේ සිංහල බෞද්ධ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීමට උත්සාහ දරමින් සිටිය දී දහතුන ධන ප්‍රකාශනයක් ඉවත දැමූ ජනතාවක් ලවා ඉන්දියාව දැන් කොටි පරාජය වී තිබිය දී එවැන්නක් ක්‍රියාත්මක කරන්නට උත්සාහ දරයි.

ඊශ්‍රායල් ක්‍රමයේ ප්‍රහාරයක් මගින් ප්‍රභාකරන් ඇතුළු කොටි නායකයන් අවසාන මොහොතේ දී වුව ද මුදාගෙන යැමේ බලාපොරොත්තුවක් බටහිරයන්ට තිබිණි. ඒ බලාපොරොත්තුව ප්‍රභාකරන්ට තිබූ බව රහසක් නො වේ. එහෙත් බටහිරයන් එසේ ප්‍රභාකරන් මුදානොගත්තේ ඉන්දියාවේ මැදිහත්වීමක් නිසා විය හැකි ය. ඉන්දියාව එසේ මැදිහත්වීමේ දී කුමක් බලාපොරොත්තුවන්නට ඇත් ද? ලංකාණ්ඩුව ලවා යම් දහතුන ධන සංශෝධනයක් ක්‍රියාත්මක කරන්නට හැකි යැයි ඉන්දියාව ඇතැම් විට සිතන්නට ඇත. එහෙත් අප මතක තබාගත යුත්තක් නම් ප්‍රභාකරන්ට බේරී යැමට ඉඩ නොදීමට ඉන්දියාවට තමන්ගේ ම වූ හේතුවක් තිබූ බව ය. ඉන්දියාව එසේ ඉඩ නොදෙන්නට ඇත්තේ ලංකාවට ඇති ආදරයක් නිසා නොව රජිව් ගාන්ධිගේ ඝාතකයා මුදාගෙන යැමට බටහිරයන්ට ඉඩ නොදීමට ඉන්දියාවට තමන්ගේ ම වූ අවශ්‍යතාවක් තිබූ නිසා ය. එබැවින් ප්‍රභාකරන්ට පැන යැමට ඉඩ නොදීම සම්බන්ධයෙන් ඉන්දියාවට ලංකාණ්ඩුවට බලපෑම් කිරීමට කිසිම අයිතියක් නැත. ඒ නැතත් අපට බලපෑම්කිරීමට ඉන්දියාවට ඇති අයිතිය කුමක් ද? ලංකාව යනු ඉන්දියාවේ සාගරයේ පිහිටි කුඩා රටක් යැයි ඉන්දියාව සිතන්නේ ද? ඉන්දියාව තම සංස්කෘතික, ආර්ථික හා දේශපාලන ආධිපත්‍යය යටතට ලංකාව ගැනීමට උත්සාහ කරයි. දිළින්දන් කෝටි ගණනක් ජීවත්ව සිටියදීත් ඉන්දියාව අද ධනවත් ය. ලෝකයේ ම ධනවතා ඇත්තේ ඉන්දියාවේ ය. ඔහුට හා ඔහුගේ සොහොයුරාට පකිස්ථානයේ කොටස් වෙළෙඳ පොළේ ඇති සියළු කොටස් මිළ දී ගත හැකි යැයි කියැවේ. සුපිරි ධනවතුන් කිහිප දෙනකු සහ දිළින්දන් කෝටි ගණන් සිටින ධනවත්කමක් අපේ ඇතැමුන්ට අවශ්‍ය වුව ද ඒ සිංහල බෞද්ධ ආර්ථිකයකට විරුද්ධ ය. අපි නිව්හැනහිල්ලේ සිංහල බෞද්ධ ආර්ථිකයක් ගොඩනගා ගනිමු. ඉන්දියාවේ බෞද්ධයෝ දිළින්දෝ ය. ගාන්ධි අම්බෙඩ්කාර් මහතාගේ ජනතාවට දෙවියන්ගේ දරුවන් යන තේරුම ඇති හරිජන් යන්න පටබැන්දේ ය. ඒ ව්‍යාජයකි. ගාන්ධිවත් වෙන අයකුවත් බෞද්ධයනට සලකා නැත. අඩුම තරමින් බුදුන් වහන්සේ වැඩ සිටි ප්‍රදේශයේ, සිංහල බෞද්ධයන්ගේ දඹදිව චාරිකාවට හසුවන ප්‍රදේශයේ, මාර්ගවත් නිසියාකාරයෙන් නඩත්තු නො කෙරෙයි. ජාතික කොඩියේ බොරුවට අශෝක චක්‍රය ප්‍රදර්ශනය කෙරුණ ද ඉන්දියාවේ බෞද්ධයනට තැනක් නැත. මුස්ලිම් ජනාධිපතිවරයකු සික් අගමැතිවරයකු ආදී වශයෙන් පත් වී තිබුණ ද බෞද්ධ අගමැතිවරයකු හෝ ජනාධිපතිවරයකු හෝ තවම ඉන්දියාවට නැත. ඉන්දියාවේ ව්‍යවස්ථාවෙහි ඓහික රාජ්‍යයක් බව සඳහන් කෙරුණ ද එහි ඇත්තේ මනු නීතිය ක්‍රියාත්මක වන හින්දු රාජ්‍යයකි. ඉන්දියාවේ බෞද්ධයනට ඇති තැන කුමක් ද? කොන් වී ඇත්තේ ලංකාවේ දෙමළ හින්දු ජනයා නොව ඉන්දියාවේ බෞද්ධයන් බව පැහැදිලි ය. ඉන්දීය බෞද්ධයන්ගේ අභිලාෂය සපුරාලනු වස් එහි බෞද්ධයන්ට බලය ලැබෙන සේ බලය විමධ්‍යගත කරන ලෙස ඉල්ලා සිටිමු ද?

ඉන්දියාවට අවශ්‍ය අන්දමට අප ක්‍රියා කළ යුතු නො වේ. ඉන්දියාව යනු අද බටහිර දියුණුව හඹායන තවත් රටක් පමණකි. ඒ රට ධනවත් වුවත් එහි ඒක පුද්ගල ආදායම ඉතා අඩු ය. එහෙත් එයට බලසම්පන්න යුද හමුදාවක් ඇත. එසේ වුවත් ඒ හමුදාවට කොටින් පැරදවීමට නොහැකි විය. අප සමහරුන් ඉන්දියාවට දක්වන්නේ හුඹස් බියකි. අද අපේ විදේශ ප්‍රතිපත්තිය හා ස්වදේශීය ප්‍රතිපත්තිය සකස් විය යුත්තේ ඉන්දියාව සැනසීමට නො වේ. අද අභ්‍යන්තරව අපට ඇති ප්‍රධාන ප්‍රශ්නය අවතැන්වූවන් ලක්ෂ තුනකට ආසන්න සංඛ්‍යාවක ප්‍රශ්නය ය. පහසුවෙන් ඔවුන් පදිංචිකරවීමට නොහැක්කේ විවිධ හේතු නිසා ය. එක් පැත්තකින් අවතැන්වූවන් අතර කොටි ද වෙති. ඒ අතර බිම් බෝම්බ ප්‍රශ්නය වෙයි. එමෙන් ම නගර නැවත නිර්මාණය කිරීම ද වෙයි. කෙසේ වෙතත් වෙනත් රටවල් සමග සම්බන්ධ කිරිමේ දී අප පැරණි සිංහල රජවරුන් අනුගමනය කළ කියා මාර්ගය ගැන අවධානය යොමු කළ යුතු ය. එදා වෛරයන් සමග ප්‍රශ්න ඇතිවූ විට සිංහල රජවරු පාණ්ඩ්‍යයන්ගෙන් ආධාර ලබාගත් හ. පාණ්ඩ්‍යයන්ට එරෙහිව පල්ලවයන්ගෙන් ආධාර ගත්හ. එසේ උපක්‍රමශීලී ව කටයුතු කිරීමෙන් අපේ ස්වෛරීභාවය රැකිණි. අද ඉන්දියාව තනි රටක් බව සැබෑ ය. ඉන්දියාවෙන් ප්‍රශ්න ඇතිවන විට අප පකිස්ථානය හා අනෙක් මුස්ලිම් රටවලින් ද, චීනය වැනි රටවලින් ද ථෙරවාදී බෞද්ධ රටවලින් ආධාර ගත යුතු ය. අද ඉන්දියාව පැරදවීම අපේ ඉහළ ම ප්‍රමුඛතාව වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva